# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2202/4 - 2020 නොවැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2020.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 නොවැම්බර් මස 18 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.10.13 දිනැති අංක 2197/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ටින්මාළු සඳහා ප්‍රකාශිත අදාළ නියමය 2020 නොවැම්බර් මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


1A - PG 5217 — 570 (2020/11)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 16.04 | 1604.11 | සැමන් | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.12 | හුරුල්ලන් | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල් මැස්සන් | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටො (සර්ඩා විශේෂයන්) | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.15 | මැකරල් | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.16 | ඇන්චෝවිසි | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.17 | ආදන් | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.19 | අනෙකුත් | කි. ග්‍රෑමයකට රු. 100 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාළු | කි. ග්‍රෑමයකට රු. 100 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.